# පුරප්පාඩු

## කථිකාචාර්ය (ආධුනික)/කථිකාචාර්ය (ස්ථිර නොකළ)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය තනතුර

කළමනාකරණය පිළිබඳ උසස් අධ්‍යාපනය සපයන ප්‍රමුඛතම ආයතනයක් වන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) මගින් සුදුසු සුදුසුකම්ලත් පළපුරුද්ද සහිත පුද්ගලයන් වෙතින් ඉහත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලබයි.

ආයතනයේ දැනට පවතින අවශ්‍යතා හේතුවෙන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණියේ පත්වීම් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත.

**විෂය ක්ෂේත්‍ර:**

* ව්‍යාපාර උපායමාර්ග * ජාත්‍යන්තර ව්‍යාපාර * උපායමාර්ගික කළමනාකරණය
* අලෙවි කළමනාකරණය * මානව සම්පත් කළමනාකරණය * මූල්‍ය කළමනාකරණය
* තොරතුරු කළමනාකරණය * ව්‍යාපෘති කළමනාකරණය * ව්‍යාපාර නීතිය

**සුදුසුකම්:**

සුදුසුකම් පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා (UGC) චක්‍රලේඛ සහ අදාළ සංශෝධන සඳහා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවිය වෙත යොමු වන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I ශ්‍රේණිය සහ කථිකාචාර්ය (ආධුනික) තනතුර | කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721, 935, 08/2016, 08/2016 (ii), 08/2016 (iii) |
| කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර | කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07/2018 |

පත්කිරීමේ අනෙකුත් කොන්දේසි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ (සංශෝධිත) සහ ඒ යටතේ සාදන ලද නියමාවලි, අතුරු ව්‍යවස්ථා, රෙගුලාසි සහ රීති ආදියෙහි විධිවිධානවලට අනුකූල වනු ඇත.

**වැටුප් පරිමාණයන්:**

| | | |
|---|---|---|
| 01 | කථිකාචාර්ය (ආධුනික) තනතුර | U-AC 3 (IV) රු. 54,600 - 10 x 1,335 - 67,950 මසකට + (115% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා) |
| 02 | කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර | U-AC 3 (III) රු. 69,580 - 5 x 1,630 - 77,730 මසකට + (131% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා) |
| 03 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර | U-AC 3 (II) රු. 79,360 - 11 x 1,630 - 97,290 මසකට + (151% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා) |
| 04 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය තනතුර | U-AC 3 (I) රු. 91,310 - 7 x 2,170 - 106,500 මසකට + (151% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා) |

**වෙනත් ප්‍රතිලාභ:**

පත්වීම්ලාභියා මාසික වැටුපෙන් 10% ක දායකත්වයක් ලබා දෙමින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ දායකයෙකු බවට පත්වනු ඇත. ආයතනය විසින් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමයට, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට මාසික වැටුපෙන් පිළිවෙලින් 8%, 7% සහ 3%කින් දායක වනු ඇත.

**තෝරා ගැනීමේ ක්‍රමය:**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අයදුම්පත් සහ විස්තර:**

උනන්දුවක් දක්වන පුද්ගලයින්ට ආයතනයේ වෙබ් අඩවිය වන www.pim.sjp.ac.lk වෙත පිවිස අයදුම්පත්‍රය සහ අනෙකුත් විස්තර බාගත කළ හැකිය.

එක් එක් තනතුර සඳහා නිසි පරිදි වෙන වෙනම සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්වල සහතික කළ පිටපත් සමඟ උපාධි, අනුපත් (transcript) සහ සේවා සහතික ලියාපදිංචි තැපැල යටතේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය, අංක 28 ලෙස්ලි රණගල මාවත, කොළඹ 08 වෙත 2023 ඔක්තෝබර් 13 හෝ ඊට පෙර එවිය යුතුය. අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. අයදුම්කරුවන්ට පහත දක්වා ඇති කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යුත් තැපැල් ලිපිනය හරහා අයදුම්පත්‍රයේ කලින් පිටපතක් එවිය හැක.

නියමිත ආකෘතිය මගින් ඉදිරිපත් නොකළ අයදුම්පත්, අසම්පූර්ණ සහ අපැහැදිලි අයදුම්පත්, උපකාරක ලේඛන සමඟ ඉදිරිපත් නොකළ අයදුම්පත්, නිසි මාර්ග හරහා යොමු නොකළ අයදුම්පත් (රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින්) සහ අවසන් දිනට පසුව ආයතනය වෙත ලැබුණු අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දිනමිණ (2023-06-28), තිනකරන් (2023-06-29), ඩේලි නිවුස් (2023-06-21) හි පළ වූ දැන්වීම්වලට ප්‍රතිචාර වශයෙන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ තනතුර සඳහා දැනටමත් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ තනතුර සඳහා නැවත අයදුම් කළ යුතු නොවේ. කෙසේ වෙතත්, ඉහත සඳහන් කළ අනෙකුත් තනතුරු සඳහා අයදුම් කිරීමට උනන්දුවක් දක්වන පුද්ගලයන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් එවිය යුතු වන්නේය.

අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය සතුවේ. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
2023.10.04


PIM
කළමනාකරණ පශ්චාත්උපාධි ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

28, ලෙස්ලි රණගල මාවත, කොළඹ 08
දුරකථනය: +94 11 2 689 639 ෆැක්ස්: +94 11 2 689 643
වෙබ් අඩවිය: www.pim.sjp.ac.lk
විද්‍යුත් තැපැල: admin@pim.sjp.ac.lk